# 20

# පාලි නිකාය සාහිත්‍යයෙහි අලංකාර භාවිතය

*ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය වෑගම පියරතන හිමි*

පාලි නිකාය සාහිත්‍යය යන්නෙන් අදහස් කෙරෙන්නේ බුදුරජාණන් වහන්සේ සහ උන්වහන්සේගේ ශ්‍රාවක ශ්‍රාවිකාවන් විසින් දේශිත වූ, ප්‍රථම සංගායනාත්‍රයයෙන් සංගායිත වූ ධර්මය ඇතුළත් දීඝ, මජ්ඣිම, සංයුත්ත, අංගුත්තර යනු මූලික නිකාය ග්‍රන්ථයන් ද, ධම්මපද ආදි ග්‍රන්ථ පසළොසකින් සමන්විත ඛුද්දක නිකාය ඇතුළු ව ග්‍රන්ථයන් එකුන් විස්සකින් යුත් පාලි සූත්‍ර පිටකය යි. ධර්මයේ ගම්භීරාර්ථ විශද කිරීම හා ශ්‍රාවකයන්ගේ සුඛාවබෝධය පිණිස බොහෝ තැන්වල දී අවස්ථාවෝචිත පරිදි අලංකාර භාවිත කර ඇති අයුරු සූත්‍රපිටකාගත විවිධ සාධකවලින් අනාවරණය වේ. විනය හා අභිධර්ම යන පිටක දෙකට ම වඩා සූත්‍ර පිටකයේ චිත්තාකර්ෂණීය ලෙස අලංකාර උපයෝගී කරගෙන ඇති බව පෙනේ. අනෙකුත් අලංකාරයන්ට වඩා උපමා හා රූපක අලංකාර දෙක වැඩිපුර ම භාවිත කර ඇති බව කිව හැකි ය. එයිනුත් සූත්‍ර පිටකයේ බහුල වශයෙන් දක්නට ලැබෙන්නේ උපමා භාවිතයයි. එහි අන්තර්ගත කරුණු විමසීමේ දී හෙළි වන්නේ පාලි සූත්‍ර පිටකය උපමා ආකරයක් වැනි බව යි.

දැනට අප අතර විද්‍යමාන පාලි අලංකාර ග්‍රන්ථ රැසැයුණේ භාරතීය අලංකාර ග්‍රන්ථ මූලාශ්‍රය කොට ගෙන ය. භාරතීය කාව්‍ය විචාරයෙහි ආදිතමයා ලෙස සැලකෙන භරත මුනිවරයා ක්‍රි. ව. දෙවන සියවසේ පමණ ජීවත් වූ කෙනෙකු ලෙස සැලකේ. ප්‍රථම ධර්මසංගීතියෙන් අනතුරුව සියවස් කිහිපයක් මුළුල්ලෙහි සිදු වූ ක්‍රමික සංවර්ධනයකින් පසු ව ථෙරවාද ත්‍රිපිටකය සම්පූර්ණත්වයට පත්වූයේ ක්‍රි.පූ තුන්වන සියවසේ දී මොග්ගලීපුත්ත තිස්ස මහරහතන් වහන්සේ විසින් අභිධර්ම පිටකයට අයත් **කථාවත්ථුප්පකරණය** රචනා කිරීමෙනි. මෙයින් ප්‍රකට වන එක් වැදගත් කරුණක් නම්, ග්‍රන්ථ එක්තිසකින් සමන්විත පාලි ත්‍රිපිටකය භාරතීය කාව්‍ය විචාරය ආරම්භ වීමට සියවස් පහකට පමණ පෙර සකස් වී තිබුණු බව යි. එබැවින් පාලි ත්‍රිපිටකයෙහි පැනෙන අලංකාර පිළිබඳ කාව්‍යමය සංකල්පයන්හි කිසියම් අපූර්වතාවක් පිළිබිඹු විය යුතුය'යි උපකල්පනය කළ හැකි ය. පාලි නිකාය සාහිත්‍යය ඇසුරෙන් එහි භාවිත කොට ඇති අලංකාරයන්හි විද්‍යමාන එම සුවිශේෂත්වය පිළිබඳ විමසීමක් කිරීම මෙම ලිපියේ මුඛ්‍ය අරමුණ යි.



## බුද්ධ කාලයට පෙර භාවිත අලංකාර

බුද්ධ කාලයටත් පෙර භාරතයෙහි ප්‍රභවය වූ පැරණිතම ආගමික සාහිත්‍ය කෘතීන් ලෙස සැලකෙන වෛදික ග්‍රන්ථවල එන සූක්තයන්හි පවා සාහිත්‍යයික අගයෙන් අනූන ගීත පාඨ හමුවේ. අර්ථය ඉතා සරල ව හා පැහැදිලි ව දැක්වීම සඳහා වෛදික කවීන් විසින් බෙහෙවින් ම උපමා හා රූපක භාවිත කොට ඇති බව පහත දැක්වෙන ඍග්වේද පාඨවලින් අනාවරණය වේ.

> "එෂා ප්‍රතීචී දූහිතා දිවො නෘන් යොෂ්වෙ භද්‍රාණි රිණිතෙ අප්සඃ"
> (ලක්ෂණ ස්ත්‍රියක පුරුෂයන් ඉදිරියෙහි අවනත වන්නාක් මෙන් මේ දෙව්ලොව දූහිතෘ වූ උසස් දෙවඟන සිය ශෝභාව පළ කරයි)

වෛදික කවියා මේ ගීතයෙහි ප්‍රභාතය උපමා කොට ඇත්තේ නව යොවුන් කෝමල කාන්තාවකට ය. ළාහිරු රැස්වලට ස්ත්‍රීත්වය ආරෝපණය කිරීමෙන් තරුණ ලඳුන්ගේ සහජ ගතියක් වූ කෝමලත්වය ප්‍රභාතයෙහි දක්නට ලැබෙන චමත්කාරජනක දර්ශනයත් සමඟ සිත් ගන්නා පරිදි සම්බන්ධ කිරීමට කවියාට හැකි වී ඇත. ආදීකාලීන වෛදික කවියන් සතු අලංකාර භාවිතයෙහි පැවති මනා දක්ෂතාව මෙයින් මැනවින් ප්‍රකට වෙයි. මෙබඳු සිත් ගන්නා සරල උපමා ඍග්වේදයේ බොහෝ සූක්තවල දක්නට ලැබේ. අර්ථය පැහැදිලි කිරීමේ අරමුණින් පමණක් නොව විස්තර කරනු ලබන විෂය ක්ෂේත්‍රය පිළිබඳ ව තාත්ත්වික අවබෝධයක් ලබා දීම සඳහා ද අලංකාර භාවිත කර ඇත. ඇතැම් විට එක ම අදහසක් පැවසීම පිණිස උපමා මාලාවක් යොදා ගෙන ඇත. සංස්කෘත ආලංකාරිකයන් විසින් එබඳු උපමා හඳුන්වා ඇත්තේ "මාලොපමා" යනුවෙනි.

> "සදො ද්වා චක්‍රාතෙ උපමා දිවි- සම්‍රාජා සර්පිරාසුති"

මෙම සූක්තයෙහි **උපමා** යන වචනය පවා යොදා ඇත. ඍග්වේදයේ පමණක් නොව අථර්වන් වේදයේ ද, ඊට පශ්චාත්කාලීන ව රැසැයුණු බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂද් යන ග්‍රන්ථවල ද උපමා රූපකාදී අලංකාර බහුල වශයෙන් දක්නට ලැබෙතත්, අලංකාරවාදයක් තිබුණු බවක් කිව නොහැකි ය. ෂඩ් වේදාංගයන් අතරට **ඡන්දස්** යන අංගය ඇතුළත් වුව ද, **අලංකාර** යන අංගය ඇතුළත් නොවීම එම කරුණ ස්ඵුට කෙරෙණ සාධකයකි. ඉහත සඳහන් නිදසුන් අනුව ප්‍රාග් බෞද්ධ යුගයේ පවා භාරතීය ජන සමාජය තුළ අලංකාර භාවිතය ජනප්‍රිය අංගයක් වූ බවට කිසිදු සැකයක් නොමැත. භාරතීය නිරුක්ති කථන සම්ප්‍රදායේ ආදී කතෘ ලෙස සැලකෙන, ක්‍රි.පූ 800-700 අතර කාලයේ විසූ යාස්ක ආචාර්යවරයා විසින් වෛදික සූක්තයන්හි අන්තර්ගත පදයන්ට අර්ථකථනය කරමින් රචිත යාස්කනිරුක්තයෙහි **උපමා, රූපක, දීපක,**

**යමක** යන අලංකාර සතරක් ගැන සඳහන් කර ඇති අතර, ඒවා මුල් කරගෙන අලංකාරවාදය ආරම්භ වූ බව විශ්වාස කෙරේ.

බුදුරදුන්ට කතෘත්වය පැවරෙණ පාලි ත්‍රිපිටකය තුළ සාහිත්‍ය විචාරයට අදාළ වන උපමා රූපකාදී කාව්‍යමය සංකල්ප පිළිබඳ නොයෙක් කරුණු දක්නට ලැබේ. එබැවින් පාලි ත්‍රිපිටකයේ සඳහන් සාහිත්‍ය විචාරමය අදහස් සංස්කෘත සාහිත්‍ය විචාරකයින්ගේ අදහස්වලට ද කිසියම් බලපෑමක් ඇති කරන්නට ඇතැ'යි අනුමාන කළ හැකි ය. මේ සඳහා ඉදිරිපත් කළ හැකි ප්‍රබල සාධකයක් නම් කාව්‍ය විචාර සම්ප්‍රදායේ දෙවන පුරුක ලෙස සැලකිය හැකි, එමෙන් ම අලංකාර ශාස්ත්‍රයේ පියා වශයෙන් විරුදාවලිය ලැබූ **භාමහ** නම් ආචාර්යවරයා බෞද්ධ පඬිවරයෙකු ලෙස සැලකීමයි. එතුමා විසින් රචිත **කාව්‍යාලංකාර** නමැති ග්‍රන්ථයෙහි **ප්‍රණම්‍ය සාර්වං සර්වඥං** යනාදී වශයෙන් දැක්වෙන ප්‍රාරම්භක පද්‍යය අනුව ද, එතුමාගේ පියාගේ නමට යෙදී ඇති **ගෝමින්** යන යෙදුම අනුව ද මෙතුමා බෞද්ධයෙකැ'යි අනුමාන කෙරේ.

පාලි සාහිත්‍යය තුළ **වුත්තෝදය** සහ **සුබෝධාලංකාරය** යන නමින් සාම්ප්‍රදායික සාහිත්‍ය විචාර ග්‍රන්ථ දෙකක් විද්‍යමාන වේ. එයින් වුත්තෝදය, දඹදෙණි යුගයේ විසූ සංඝරක්ඛිත තෙරුන් වහන්සේ විසින් පාලි කාව්‍යයන්ට උචිත ඡන්දස් ශාස්ත්‍රය ඉගැන්වීම සඳහා, කේදාරභට්ට ආචාර්යවරයා විසින් විරචිත සංස්කෘත වෘත්තරත්නාකරය මූලාශ්‍රය කරගෙන රචනා කරන ලද්දකි. උන් වහන්සේ විසින් ම පාලි කාව්‍යයට උචිත අලංකාර ශාස්ත්‍රය ඉගැන්වීම සඳහා **සුබෝධාලංකාරය** රචනා කරන ලද්දේ දණ්ඩින් විසින් විරචිත සංස්කෘත **කාව්‍යාදර්ශය** ගුරු කොට ගෙනය. මේ අනුව පාලි කාව්‍ය විචාර ග්‍රන්ථයන්ට භාරතීය සංස්කෘත විචාර ග්‍රන්ථයන්හි ආභාසය ලැබී ඇති බවට කිසිදු සැකයක් නැත.

## උපමා සහ රූපක අලංකාර

භාරතීය කාව්‍ය විචාරයට අනුව උපමා සහ රූපක යනු පන්තිස් අලංකාරයන්ට අයත් ප්‍රධාන අලංකාර දෙකකි. පාරිභාෂික පදයක් වශයෙන් සංස්කෘත විචාර කලාවේ යෙදී ඇති **අලංකාර** යන පදය **අලං** යන්නත් **කර** (කරණෙ) යන ධාතුවෙන් නිපන් **කාර** යන්නත් ගැළපීමෙන් සිද්ධ වී ඇත. අලංකාර කිරීම, සැරසීම, ලස්සණ කිරීම යන අර්ථය ඉන් පැවසේ. මේ අනුව කාව්‍යයක සෞන්දර්යය ඇති කරන අංග අලංකාර යන නමින් හැඳින්විය හැකිය. අලංකාර යන්න වෙනුවට ඍග්වේදයේ යෙදී ඇත්තේ **අලංකෘත** යන්නය. එහි අදහස අලංකාර කරන ලද යනුයි. කිසියම් අදහසක් පාඨකයන්ගේ සිත් ඇද ගන්නා පරිදි රසවත් ලෙස අලංකාර භාවිත කරමින් ප්‍රකාශ කෙරේ නම් ඒවා අලංකාරාත්මක වදන් ලෙස අගය කළ හැකිය. **අර්ථාලංකාර** හා **ශබ්දාලංකාර** යනුවෙන් ප්‍රධාන



වශයෙන් අලංකාර දෙවැදෑරුම් වේ. අර්ථය සරසන අලංකාර අර්ථාලංකාර යනුවෙන් ද, ශබ්දය සරසන අලංකාර ශබ්දාලංකාර යනුවෙන් ද දැක්වෙන අතර, සියලු අර්ථාලංකාර අතුරෙන් උපමාලංකාරයට ප්‍රමුඛ ස්ථානය හිමි වේ. දණ්ඩින් අලංකාර හඳුන්වා ඇත්තේ "කාව්‍යය ශෝභා සම්පන්න කරන කරුණු" යනුවෙනි. රසය ආත්මය කොට ඇති කාව්‍යය නමැති කාන්තාවගේ ශබ්දාර්ථ නමැති ශබ්දය ශෝභාසම්පන්න කරන උපමා, යමක, රූපකාදිය අලංකාර යන නමින් හැඳින්වේ.

අලංකාර ශාස්ත්‍රය වූකලී පාලි ත්‍රිපිටකය සම්පූර්ණ වී සියවස් පහකට පමණ පසු ව ඇති වූ විචාර ක්‍රමයක් බැවින් එයට අනුලෝම වන අදහස් පාලි ත්‍රිපිටකයෙහි දැක ගත නොහැකි වේ. අලංකාර යන පදයට පර්යාය වශයෙන් පේළි යෙදී ඇති **මණ්ඩන** යන වචනයෙහි සැරසීම යන අර්ථය ඇතත් සාහිත්‍යමය අදහසින් එය පෙළෙහි යෙදී ඇති බවක් නො පෙනේ. පාලි ත්‍රිපිටකය පුරා ව්‍යාප්ත ව ඇති උපමා සහ රූපක යන ප්‍රයෝගයන් අලංකාර වශයෙන් හඳුන්වා නැතත් පශ්චාත්කාලීන සාහිත්‍ය විචාරකයින් ඒවා අලංකාර ලෙස පිළිගෙන ඇත.

## උපමාලංකාරය

**උප** යන උපසර්ගයත්, '**මා**' (පමාණෙ) යන ධාතුවත්, ගැළපීමෙන් උපමා, උපමාන යන පද සිද්ධ වේ. **උප** යන උපසර්ගය උපගමන, සමීප, සදෘශා දී අර්ථ රාශියක යෙදෙන අතර, මෙහි දී සදෘශාර්ථයෙහි යෙදී ඇත. ඒ අනුව උපමා යන පදයෙන් 'යම් ප්‍රමාණයක් සමාන කිරීම' යන අර්ථය ලැබේ. උපමාන සහ උපමේයයන්ගේ සමාන ධර්මතාව **උපමා** යන නමින් හැඳින්වෙන බව ආලංකාරිකයන්ගේ ඉගැන්වීමයි. යමක් යමකට සමාන කරනු ලැබේ නම් ඒ සමාන වශයෙන් සලකන දෙය '**උපමා**' හෙවත් '**උපමාන**' නම් වන අතර, යමක් හා සමාන කරනු ලබන දෙය '**උපමේය**' නම් වේ. පහත දැක්වෙන සරල නිදසුනින් උපමා උපමේයයන්ගේ වෙනස මැනවින් පැහැදිලි කර ගත හැකිය.

"නිබ්බන්ති ධීරා යථායං පදීපො"
(මේ පහන මෙන් රහතුන් වහන්සේලා නිවී යති)

| උපමේය | උපමා |
|---|---|
| රහතුන් වහන්සේ | පහන |
| පිරිනිවන් පෑම | නිවී යාම |
| කෙලෙස් | ඉන්ධන |

මෙහි කෙලෙසුන් සුන්කොට පිරිනිවන් පාන රහතුන් වහන්සේ ඉන්ධන නිම වීමෙන් නිවී යන පහනකට උපමා කොට ඇත. එම උපමාව ප්‍රකට කරන නිපාතය 'යථා' යනු යි. රහතුන් වහන්සේලාගේ තත්ත්වය පැහැදිලි කිරීමට මෙහි දී බුදුරදුන් යොදා ගත් උපමාව

අතිශයින් උචිත ය. පහන දැල්වෙන්නේ ඉන්ධන හේතු කොට ගෙනය. එමෙන් ම සත්ත්වයාගේ පැවැත්ම ඇති වන්නේ ද කෙලෙස් හේතු කොටගෙන ය. එමෙන් ම සත්ත්වයාගේ පැවැත්ම ඇති වන්නේ ද කෙලෙස් හේතු කොට ගෙනය. මෙහි පැනෙන උපමා සහ උපමේයයන්ගේ සමාන ධර්මතාව නම් එම හේතුඵලයන්ගේ සම්බන්ධයයි. යම් හේතුවක් නිසා යම් ඵලයක් හටගනී ද ඒ හේතුව නැති කිරීමෙන් ඒ ඵලය ද නැති වේ යනු ඒ ධර්මතාවයි. මේ නිසා රහතුන් වහන්සේලා පහනක් වැනිය යි පැවසූ විට එහි සම්පූර්ණයෙන් ම සමාන වීමක් අදහස් නො කෙරේ. යම් කිසිවක් තව එකක් හා සමාන කොට පැවසීමේ දී එම වස්තු දෙකෙහි සෑම අංගයක් ම එක හා සමාන විය යුතුයයි නො සැලකේ. කුමන වස්තුව වුවත් තවත් වස්තුවක් හා සම්පූර්ණයෙන් ම සමාන නො වේ. උපමාව සඳහා යොදා ගත් වස්තුවෙහි යම්කිසි එක් ගුණයක් හෝ කීපයක් සමග උපමේය වස්තුව සමාන කිරීම මෙහි දී අදහස් කරනු ලැබේ. යම්කිසි දෙයක් විස්තර කිරීමට අවශ්‍ය වූ විට ගුණයෙන් ඊට සමාන වූ යම් දෙයක් සිතින් සලකා ගෙන එය හා සමාන කර දැක්වීම උපමාලංකාරයෙහි සාමාන්‍ය ස්වභාවය යි. එහෙත් ඇතැම් විට කවීන් ඊට වඩා වෙනස් ක්‍රම ද භාවිත කර ඇත. උපමා දැක්වීමේ දී නිතර ම මතකයට නැගෙන්නේ ස්වරූපයෙන් හෝ ගති ලක්ෂණවලින් සමාන වූ ලොව විද්‍යමාන හෝ මනඃකල්පිත කිසියම් වස්තුවකි. වර්ණනා කිරීමට අදහස් කරන වස්තුව හා සමාන කිරීමෙන් එහි අගය වටහා දීම උපමා භාවිතයෙහි මුඛ්‍ය අරමුණ යි.

පාලි සාහිත්‍යයෙහි ඉව, විය, එවං, එවමෙව, යථා, තථා, තථාරූපං, යාදිස, තාදිස, යථාපි, සෙය්‍යථාපි, කප්ප, සදිස, සන්නිභ, භූතපුබ්බං යනාදිය උපමා වාචක පද වශයෙන් යෙදී ඇත. ඇතැම් විට එබඳු උපමාද්‍යෝතක නිපාත පදයක් නොමැති ව වුවද උපමා උපමේයයන්ගේ සාම්‍යය ගම්‍ය වේ. නිදසුනක් වශයෙන් පහත දැක්වෙන ගාථාර්ධයෙහි උපමාව ප්‍රකට කෙරෙන නිපාත පදයක් යෙදී නොමැති අයුරු පෙන්වා දිය හැකි ය.

> "උදබින්දුනිපාතෙන - උදකුම්භොපි පූරති
> පූරති බාලො පාපස්ස - ථොකථොකම්පි ආචිනං"
> (දිය බිඳ බිඳ එක් වීමෙන් දිය කළය පිරෙයි. (එමෙන් ම ) ටික ටික වුව ද (පව්) රැස් කරණ බාලයා පවෙන් පිරෙයි)

ගුණයෙන් හිස් වූ අඥානයා හිස් කළයකට උපමා කිරීම අතිශයින් උචිත ය. දිය බින්දුව බැගින් එකතු ව හිස් කළය පිරෙන්නාක් මෙන් පව් ටික ටික එකතු වීමෙන් බාලයා ද පව්කාරයෙකු වන බව උපමාවෙන් මැනවින් ප්‍රකට කෙරේ. දෛනික පරිසරයේ සුලභ ව දක්නට ලැබෙන සරල උපමා භාවිත කිරීමෙන් පාඨකයින් එහි අර්ථය පහසුවෙන් අවබෝධ කර ගත හැකිය.



## රූපකාලංකාරය

උපමා හා උපමේය යන දෙදෙනාගේ සමානත්වය හේතු කොටගෙන ඒවා වස්තූන් දෙකක් ලෙස නොසලකා එකක් ලෙස නිරූපණය කිරීම රූපකාලංකාරය ලෙස හැඳින්වේ.

රූපක යනු යම් දෙයක පවත්නා ස්වරූපයට සමාන කිරීම යන අර්ථය ඇති වචනයකි. මේ අනුව උපමාලංකාරයේ හා රූපකාලංකාරයේ සැලකිය යුතු වෙනසක් නො පෙනේ. කවියා විස්තර කිරීමට බලාපොරොත්තු වන උපමේයට යම් ගුණයකින් සමාන වූ වෙනත් වස්තුවක් උපමා වශයෙන් ගෙන ඒ වස්තු දෙක අතර ඇති සමානත්වය පෙන්වීම උපමාලංකාරයයි. ඒ වස්තු දෙකෙහි ඇති සමානත්වය වැඩි වීම නිසා ඒවා එකක් ලෙස දැක්වීම රූපකයේ මුඛ්‍ය ලක්ෂණයයි. උපමාලංකාරයේ මෙන් ඉව, විය, යථාපි යනාදී සමානත්වය පැවසෙන නිපාත පද රූපකාලංකාරයේ දී නොයෙදීම විශේෂත්වයයි. මේ සඳහා පහත දැක්වෙන නිදසුන් වැදගත් වේ.

> චන්දනං තගරං වාපි - උප්පලං අථ වස්සිකී
> එතෙසං ගන්ධජාතානං - සීලගන්ධො අනුත්තරො"
> (සඳුන් තුවරලා මානෙල්, දෑසමන් යනාදී සියලු මල් ජාතීන්ට වඩා සිල් සුවඳ ඉතා උතුම් ය)

සීලයෙහි ඇති අගය දැක්වීමට මෙහි චිත්තාකර්ෂණීය රූපකාලංකාරයක් භාවිත කර ඇත. තව ද, සුත්තනිපාතයෙහි එන ඉතා ප්‍රකට සූත්‍රයක් වන කසීභාරද්වාජ සූත්‍රයෙහි ධර්ම කරුණු පැහැදිලි කිරීමේ දී බුදුරදුන් රූපකාලංකාරය භාවිත කර ඇති අයුරු පැහැදිලි කර ගත හැකිය. කෘෂිකර්මාන්තයෙහි නිරත ව සිටින ගොවියන්ට සිය දෛනික ජීවිතයේ දී නිතර දැක හුරු පුරුදු වස්තූන් උපයෝගි කරගෙන ගැඹුරු ධර්ම පර්යායයන් මෙහි දී සරල අන්දමින් පැහැදිලි කර දීමට සමත් වී ඇති අයුරු පෙනේ.

> "සද්ධාබීජං තපොවුට්ඨි - පඤ්ඤා මෙ යුගනංගලං
> හිරි ඊසා මනොයොත්තං - සති මෙ ඵාලපාචනං"
> "ශ්‍රද්ධාව නමැති බීජය ද, තපස නමැති වර්ෂාව ද, ප්‍රඥාව නමැති වියගස හා නඟුල ද, පවට ඇති ලජ්ජාව නමැති කෙවිට ද, සිත නමැති කඹය ද, සිහිය නමැති හී වැල හා කෙවිට ද යනාදි වශයෙන් ගැමියන් දන්නා දේවල් ඇසුරු කරගෙන ගැඹුරු ධර්ම කරුණු විවරණය කරන ආකාරය කොතරම් ප්‍රශංසනීය ද?

මෙහි දී බුදුසමයෙහි එන ලෝකයෙහි පවත්නා සත්‍යය අවබෝධ කර ගැනීමෙහි ලා මූලික පදනම හැටියට විස්තර කෙරෙන ශ්‍රද්ධාව නමැති ගුණාංගය බීජයකට සමාන කිරීම අතිශයින් වැදගත්ය. ගොවිතැනෙහි අවසාන අරමුණ සරු අස්වැන්නක් නෙළා ගැනීම යි. එමෙන් ම බුදුසසුනෙහි අරමුණ අමාමහ නිවනයි.

## පාලි සූත්‍ර පිටකයේ උපමා සහ රූපක අලංකාර භාවිතය

බුදුසමයේ මූලික අරමුණ වූයේ සිය ශ්‍රාවකයින්ට යථාර්ථය අවබෝධ කරවීම යි. එම කාර්යය වඩාත් පැහැදිලි ව ඉටු කිරීම සඳහා සුදුසු පරිදි උපමා සහ රූපක භාවිත කර ඇතත් අතිශයෝක්ති උත්ප්‍රේක්ෂා ආදි වෙනත් අලංකාරවලට මුල් තැනක් දී ඇති බවක් නො පෙනේ. අලංකාර ශාස්ත්‍රයේ උපමා නිර්දේශ කර ඇති ආකාරයට පමණක් නොව ඊට තරමක් වෙනස් වූ ආකාරයකින් ද පාලි සූත්‍ර පිටකයේ උපමා ප්‍රයෝගය දක්නට ලැබේ. ආලංකාරිකයන් විසින් උපමාව නිර්දිෂ්ට කර ඇත්තේ ඉව විය යනාදී නිපාත මගින් යමක් යමකට සමාන කොට දැක්වීමයි. සූත්‍ර පිටකයෙහි එබඳු උපමා බහුල වශයෙන් දක්නට ලැබේ. එහෙත් යම් කරුණක් පිළිබඳ ව නිවැරැදි දැනුමක් ලබා දීම සඳහා සුදුසු ඥාන ප්‍රමාණයක් ලෙස බුද්ධකාලීන සමාජයේ පුළුල් වශයෙන් උපමා භාවිත කොට ඇති ආකාරය සූත්‍රපිටකාගත විවිධ සාධකවලින් අනාවරණය වේ. අර්ථෝද්දීපනය සඳහා උපමා භාවිත කොට ඇති බොහෝ අවස්ථාවල උපමා යන පදය පවා දක්නට ලැබෙන අතර එබඳු උපමාවලින් අපේක්ෂා කොට ඇත්තේ කිසියම් ප්‍රස්තුතයක් සමස්තයක් වශයෙන් විවරණය කොට දැක්වීමයි. සූත්‍රපිටකයේ උපමා යන ප්‍රයෝගය යෙදී ඇති අවස්ථා කීපයක් මෙයට නිදසුන් වශයෙන් පහත දැක්වේ.

1. "තෙනහි සන්දක, උපමං තෙ කරිස්සාමි, උපමායපි ඉධෙකච්චේ විඤ්ඤූ පුරිසා භාසිතස්ස අත්ථං ආජානන්ති"
   (එසේ නම් සන්දක, ඔබට උපමාවක් ප්‍රකාශ කරන්නෙමි. මෙලොව ඇතැම් නුවණැති පුරුෂයෝ උපමාවෙන් ද භාෂිතාර්ථය දැනගනිති)

2. "උපමං ආවුසො සාරිපුත්ත පටිභාති"
   (ඇවැත් ශාරීපුත්‍රය, මට උපමාවක් වැටහේ)

3. "උපමා ඛො අයං භික්ඛවෙ කතා අත්ථස්ස විඤ්ඤාපනාය"
   (මහණෙනි අර්ථය අවබෝධ කරවීම සඳහා මවිසින් මේ උපමාව කරන ලදි)

4. "සබ්බේ තසන්ති දණ්ඩස්ස - සබ්බෙ භායන්ති මච්චුනො
   අත්තානං උපමං කත්වා - න හනෙය්‍ය න ඝාතයෙ"
   (සියලු දෙනා දඬුවමට බිය වෙති. සියලු දෙනා මරණයට බිය වෙති. තමා උපමා කොට අනුන්ට හිංසා නොකළ යුතු ය. නො මැරිය යුතු ය)

5. "කුල්ලූපමං වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි, නිත්ථරණත්ථාය නො ගහණත්ථාය"



   (මහණෙනි, පහුරකට උපමා කොට ධර්මය දේශනා කරන්නෙමි. එය එතෙරවීම සඳහා මිස ඔසවා ගෙන යාම සඳහා නොවේ)

6. "එවමෙව ඛො භාරද්වාජ, අන්ධවේණූපමං මඤ්ඤෙ බ්‍රාහ්මණානං භාසිතං සම්පජ්ජති"
   (භාරද්වාජ, එමෙන් ම බ්‍රාහ්මණ භාෂිතය අන්ධ රැළකට සමාන යැයි සිතමි)

ඉතා සරල වූ හා තාත්ත්වික උපමා මගින් සූක්ෂ්ම ධර්මයන් පැහැදිලි ව ඉදිරිපත් කිරීම සූත්‍රපිටකයේ ආවේණික ලක්ෂණයක් වූ බව **ධම්මපදය**, **ජාතකපාලි**, **ථෙරගාථා**, සහ ථෙරීගාථා වැනි ග්‍රන්ථවල එන ගාථා ප්‍රබන්ධවලින් මැනවින් හෙළි වේ. ධර්මය ඉතා පහසුවෙන් අවබෝධ කරවීමට මෙන් ම, ස්වකීය ශ්‍රාවකයින්ට නීරසයකින් තොර ව ශ්‍රවණය කිරීමටත් මෙම ක්‍රමය හේතු වූවාට කිසිදු සැකයක් නැත.

"මලින් මලට යමින් මල්පෙති නොතලා එහි ඇති ප්‍රියංකර වර්ණයටත් සුගන්ධයටත් කිසිදු හානියක් නොකර මල් රොන් ගන්නා බමරෙකු මෙන් බෞද්ධ මුනිවරයා ද මහජනතාවගේ ශ්‍රද්ධාදී ගුණධර්මවලට කිසිදු හානියක් නොවන පරිදි ගමෙහි හැසිරිය යුතු ය."

මෙහි මුනිවරයා ගෙයින් ගෙට යාම මීමැස්සා රොන් සොයා මලින් මලට යාමට සමාන කිරීම ඉතා සරල උපමාවකි. මීමැස්සාගේ ගමනින් මලෙහි වර්ණයට වත් සුගන්ධයට වත් කිසිදු හානියක් නො වේ. ඌ කරන්නේ මලින් රොන් උරා බීම පමණකි. මීමැස්සාගේ මෙන් මුනිවරයාගේ අරමුණක් වූයේ අහර සොයා යාමය. එම ගමනින් ගමේ ජනතාවගේ සිත්සතන් නොතැළෙන පරිදි හැසිරිය යුතු යැයි ඉගැන්වීමට මීටත් වඩා හොඳ උපමාවක් තිබේ ද? එබැවින් මෙය හැම අතින් ම උචිත උපමාවකි.

බුද්ධ දේශනාවලින් වැඩි හරියක් උපමාලංකාරයෙන් යුක්ත වීම අපූර්වතාවකි. සංස්කෘත සාහිත්‍යයෙහි මෙන් නොදුටු දෙව් විමන්, කල්ප වෘක්ෂය, භද්‍රඝටය වැනි අද්භූත ලෝකයන්ගෙන් ගත් වස්තූන් නොව ඇතුන්, අසුන්, මසුන්, සිංහයින්, මුවන්, වඳුරන්, විහඟුන් ගවයින්, උරගයින්, කැටපත්, පහන්, මල්, වැල්, ගැල් නඟුල්, වියගස්, රුක්, සක්, වැසි, සඳු, හිරු, සමුදුරු, ගංගා, පර්වත, ගිනි, වන, උයන්, පොකුණු යනාදී සැබෑ ගැමි ජීවන රටාව පවතින පරිසරය තුළ එදිනෙදා දක්නට ලැබෙන ස්වාභාවික වස්තූන් උපමා හා රූපක සඳහා භාවිත කිරීම සූත්‍රපිටකයේ සුවිශේෂත්වයකි. බුදුරජාණන් වහන්සේ උපමා දැක්වීමේ දී ඇසට හමුවන්නක් ඉදිරිපත් කළ බව පෙනේ. ගැමි පරිසරයට හා ඔවුන්ගේ අත්දැකීම්වලට සමීප වූ තරමට ම එම උපමාවලින් පැවසෙන අර්ථය ද තීව්‍ර වේ. එනිසා ම අර්ථාවබෝධයෙහි ලා ඒවා අතිශයින් වැදගත් වේ.

කෙස්, ලොම්, නිය, දත් යනාදී කොටස් දෙතිසකින් සමන්විත සිරුර විවිධ නම් ගොත්වලින් හඳුන්වන ලබන්නේ හඳුනා ගැනීමේ

පහසුව පිණිස ය. එම කරුණ සූත්‍රපිටකයෙහි විශ්ලේෂණය කොට ඇත්තේ රථෝපමාව ඇසුරෙනි.

"රෝද යනාදී අංග සමූහය එක් වූ කල්හි "රථය" යන ශබ්දය පවතී ද එමෙන් ම ස්කන්ධ පහ එක්වූ කල්හි "සත්ත්වයා" යන සම්මුතිය පවතී යැයි බුදුරජාණන් වහන්සේ වදාළ සේක"

යම්කිසි අගුණයක් උපහාසයට ලක් කොට එහි යථා තත්ත්වය පහදා දෙමින් ස්වකීය ශ්‍රාවකයින් නියම ගුණධර්මයෙහි පිහිටුවීමේ අපේක්ෂාවෙන් උපමා භාවිත කර ඇති අවස්ථා දක්නට ලැබේ. නූගත්කම පහත් කොට සලකා නුවණැති බව ශ්‍රාවකයින් තුළ දියුණු කර ගනු පිණිස බුදුරජාණන් වහන්සේ දුන් උපදේශය තුළ සියුම් උපහාසයක් ගැබ් වී ඇති බව පහත දැක්වෙන නිදසුනෙන් පෙනේ.

"අල්පශ්‍රැතයා ගොන් වස්සෙකු මෙන් ජරාවට පැමිණේ. ඔහුගේ මස්ගොබ තරබාරු ව වැඩේ. එහෙත් ප්‍රඥාව නම් නොවැඩේ"

මෙය කියවන පාඨකයා තුළ කිසියම් හාස්‍යයක් ජනිත වේ. හාස්‍යජනනය වනාහී රසොද්දීපනයට හේතු වන කරුණක් ලෙස ද කාව්‍ය විචාරකයින් විසින් පිළිගෙන ඇත.

සූත්‍ර පිටකාගත ඇතැම් දේශනාවන් අවසානයෙහි බුදුරජාණන් වහන්සේට ස්තුති කිරීම් වශයෙන් යම් යම් පුද්ගලයින් විසින් ප්‍රකාශ කරන ලද එක ම ක්‍රමයක වාක්‍යයක් දක්නට ලැබේ. එහි ද උපමාලංකාරය යෙදී ඇත.

"පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා ශ්‍රේෂ්ඨයි. ඉතා ශ්‍රේෂ්ඨයි. යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නාක් මෙන් ද වැසුණු දෙයක් විවර කරන්නාක් මෙන් ද අඳුරෙහි තෙල් පහනක් දල්වන්නාක් මෙන් ද ඔබ වහන්සේ ඉතා මැනවින් දහම් දෙසූ සේක. අද පටන් කොට දිවි හිමි කොට සරණ යමි"

## සමාලෝචනය

බුද්ධ කාලයටත් පෙර පටන් භාරතයෙහි පැවති වෛදික ආගමික සාහිත්‍යයෙහි පවා චිත්තාකර්ෂණීය උපමා හා රූපක අලංකාර භාවිත කර ඇත. එහෙත් පාලි සූත්‍ර පිටකය රචනා වූ යුගය වන විට ඒවා ඉතා දියුණු ආකාරයකින් බෞද්ධ සාහිත්‍යයට පිවිස ඇති බවක් පෙනේ. පාලි සාහිත්‍ය විචාරයට බලපෑ සංස්කෘත කාව්‍ය විචාර ග්‍රන්ථ රචනා වීමට සියවස් ගණනකට ඉහත දී පාලි ත්‍රිපිටකය සම්පූර්ණ වී තිබුණි. බුදුසමයේ මූලික අරමුණ වූයේ මිනිසාට යථාර්ථය අවබෝධ කර ගැනීම සඳහා මඟ පෙන්වීම යි. එබැවින් සංස්කෘත සාහිත්‍යයෙහි මෙන් දේශනා පාලියෙහි අලංකාරෝක්තීන්ට වැඩි නම්‍යතාවක් දක්නට නොලැබේ. බුදුරජාණන් වහන්සේ ස්වකීය ශ්‍රාවකයන්ට ධර්ම දේශනා කිරීමේ ක්‍රමෝපායක් වශයෙන් ගද්‍ය පද්‍ය දෙකෙහි ම උපමා හා රූපකාලංකාර ඉතා සාර්ථක ලෙස භාවිත කොට ඇත. වෛදික උපමාවන්ට වඩා



බුදුරදුන් භාවිත කළ උපමාවල සුවිශේෂත්වයක් පාලි සූත්‍ර පිටකාගත ඉපැරණි සූත්‍රවලින් අනාවරණය වේ.

ශ්‍රාවකයන්ගේ සිත්සතන් මැනවින් හඳුනාගෙන අවස්ථාවෝචිත පරිදි අලංකාර භාවිත කළ බැවින් අපේක්ෂිතාර්ථය ඉටු කර ගැනීමට හැකි වී තිබේ. බුදුරදුන් පමණක් නොව උන්වහන්සේගේ සමීපතම ශ්‍රාවකයින් පවා උචිත උපමා භාවිතයෙහි මනා කුශලතාවක් දක්වා ඇති බව පෙනේ. සූත්‍ර පිටකයෙහි උපයුක්ත උපමා ඉතා සරලය. එමෙන් ම ස්වාභාවිකය. බුද්ධදේශනාවලින් වැඩි ප්‍රමාණයක් උපමාවන්ගෙන් යුක්ත බවත් සංයුක්ත හා වියුක්ත සංකල්ප පැහැදිලි කිරීමේ දී ඉතා ප්‍රකට වූත් පැහැදිලි වූත් දෛනික ජීවිතයේ නිතර දක්නට ලැබෙන උපමාවන් පමණක් තෝරා ගෙන ඇත. ඇතැම් සූත්‍ර සම්පූර්ණයෙන් ම උපමාවලින් යුක්ත ය. ධර්මය පිළිබඳ සුබාවබෝධයක් ලබා දී ශ්‍රාවක මනස ධර්මයට යොමු කරවීමේ මාධ්‍යයක් වශයෙන් ද අලංකාර භාවිත කර ඇත.

### පාදක සටහන්

1. තිලකසිරි ජයදේව, **සංස්කෘත නාට්‍ය සාහිත්‍යය**, සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ස් සමාගම, කොළඹ, ප්‍රථම මුද්‍රණය, 1971, 164 පිටුව.
2. Macdonel Arthur Antony, A Vedic Reader for students, ^Mac.V. R&V. 80.6, Oxford University Press, Third Edition, 1957, P92
3. Mac. V.R., Viii. 29.9, P. 151
4. **කාව්‍යාදර්ශය**, (ප්‍රථම භාගය), සංස්කරණය, පේමරතන හිමි, වැලිවිටියේ, කොළඹ, 1951, 54 පිටුව
5. කාව්‍යශොභාකරාන්ධර්මානලංකාරාන් ප්‍රචක්ෂතෙ, **කාව්‍යාදර්ශය**, (එම) 53 පිට.
6. "උපමානොපමෙය්‍යානං - සධම්මත්තං සියොපමා<br>සද්දත්ථගම්මා වාක්‍යත්ථ - විසයාති ච සා තිධා"<br>**සුබොධාලංකාරය**, ද්විතීය සංස්කරණය, ලංකානන්ද නාහිමි ලබුගම, හොරණ, 1947, 198 පිටුව.
7. **සුත්තනිපාතය**, ත්‍රිපිටක බුද්ධ ජයන්ති මුද්‍රණය, (ත්‍රි.බු.ජ.) 1977, 72 පිටුව
8. **සුබොධාලංකාරය**, එම, 203 පිටුව
9. ධ.ප. (එම), පාපවග්ග, 6 ගාථාව, 78 පිටුව.
10. **සුබොධාලංකාරය**, එම, 222 පිටුව
11. **මජ්ඣිම නිකාය**, (ම.නි.) ත්‍රි.බු.ජ. (2.3.8), 328 පිටුව.
12. (ම.නි.) ත්‍රි.බු.ජ. (1.1.5), 70 පිටුව
13. (ම.නි.) ත්‍රි.බු.ජ. (1.3.5), 382 පිටුව
14. ධ.ප. (එම) දණ්ඩ වග්ග, 2 ගාථාව, 82 පිට.
15. (ම.නි.) ත්‍රි.බු.ජ. (1.3.25), 336 පිටුව
16. (ම.නි.) ත්‍රි.බු.ජ. (2.2.5), 656 පිටුව.
17. "යථාපි භමරො පුප්ඵං - වණ්ණගන්ධං අහෙඨයං<br>පලෙති රසමාදාය - එවං ගාමෙ මුනී චරෙ" ධ.ප. (එම) පුප්ඵ වග්ග, 6 ගාථාව, 42 පිට
18. සං.නි. ත්‍රි.බු.ජ. ප්‍රථම භාගය, 246 පිටුව.
19. (ම.නි.) ත්‍රි.බු.ජ. (2.1.4), 52 පිටුව.